# ත්‍රිපිටකයේ ඓතිහාසික සංවර්ධනය අධ්‍යයනයෙහි ලා පරියත්ති අන්තර්ධානය පිළිබඳ අට්ඨකථා විවරණයෙන් ලැබෙන පිටිවහල

අශෝක වැලිතොට[1]

## හැඳින්වීම

අට්ඨකථා විවරණයට අනුව බුද්ධවචනය ඇතුළත් ත්‍රිපිටකය හා තදනුබද්ධ අට්ඨකථා පරියත්ති යන්නෙන් අර්ථවත් කෙරේ. ඒ අනුව ත්‍රිපිටකය හා තදනුබද්ධ අට්ඨකථා අන්තර්ධාන වන්නේ කෙසේ ද යන්න පිළිබඳ අට්ඨකථා විවරණය පරියත්ති අන්තර්ධානය යන්නෙන් අදහස් කරනු ලැබේ. සූත්‍රපිටකයට අයත් ඛුද්දකනිකාය ත්‍රිපිටකයට අයත් සාහිත්‍යාංගයකි. එහෙත් එම නිකායයේ අන්තර්ධානය පිළිබඳ ව පරියත්ති අන්තර්ධානයෙහි සඳහන් නොවේ. සද්ධර්ම අන්තර්ධානය පිළිබඳ ව සාකච්ඡා කරන තොසිඉචි එන්දො මෙම කරුණ කෙරෙහි අවධානය යොමු කොට නොමැත (Endo 2013, pp. 119-140). ඔලිවර් අබේනායක මේ පිළිබඳ ව සාකච්ඡා කරයි. එතුමන්ගේ සාකච්ඡාව ද කරුණු කිහිපයකට සීමා වී ඇත (Abeynayake 1984, p. 55). ඒ අනුව ත්‍රිපිටකයේ ඓතිහාසික සංවර්ධනය අධ්‍යයනයෙහි ලා පරියත්ති අන්තර්ධානය පිළිබඳ අට්ඨකථා විවරණයෙන් ලැබෙන පිටිවහල සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂා කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

දීඝනිකායට්ඨකථාව, මජ්ඣිමනිකායට්ඨකථාව, සංයුත්තනිකායට්ඨකථාව, විනයට්ඨකථාව සහ විභඞ්ගට්ඨකථාව යන අට්ඨකථාවන්හි පරියත්ති අන්තර්ධානය පිළිබඳ විවරණ ඇතුළත් වේ. එහෙත් ඒ පිළිබඳ දීර්ඝ විවරණයක් ඇතුළත් වන්නේ මනෝරථපූරණී නමැති අඞ්ගුත්තරනිකායට්ඨකථාවෙහි ය. එනිසා එම අට්ඨකථාවට මූලිකත්වය දෙමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදු කරන ලද මෙම පර්යේෂයේ දී සන්ධාර විශ්ලේෂණ ක්‍රමය අනුගමනය කරන ලදි.

## සාකච්ඡාව

පරියත්ති අන්තර්ධානය පිළිබඳ මනෝරථපූරණීයෙහි ඇතුළත් විවරණයට අනුව රජතුමන් ප්‍රමුඛ රට වැසියන් අධාර්මික වූ කල්හි කලට වැසි නොවසී. කලට වැසී නොලැබීමෙන් ධාන්‍ය නිෂ්පාදනය අඩාළ වේ. ධාන්‍ය නිෂ්පාදනය අඩාළ වූ කල්හි දායකයෝ භික්ෂූන් වහන්සේට ප්‍රත්‍ය පහසුකම් සැලසීමට අසමත් වෙති. ප්‍රත්‍ය පහසුකම් නොලැබීම හේතුවෙන් අපහසුතාවට පවත් වන භික්ෂූන් වහන්සේ සිය අන්තේවාසිකයිනට සංග්‍රහ කිරීමට අපොසත් වෙති. ප්‍රත්‍ය පහසුකම් නොලබන භික්ෂූන් වහන්සේ ත්‍රිපිටකය

1. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.
awelitota@gmail.com

හා තදනුබද්ධ අට්ඨකථා ආරක්ෂා කිරීමේ අපහසුතාවට මුහුණ දෙති. අට්ඨකථා ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව නොසලකා හරින උන්වහන්සේලා ත්‍රිපිටකය ආරක්ෂා කිරීමට පෙළඹෙති. උන්වහන්සේලාට එම කාර්යය ඉටුකිරීමට ද නොහැකි වේ. ඒ හේතුවෙන් අභිධර්ම පිටකයට අයත් පට්ඨානප්පකරණය, යමකප්පකරණය, කථාවත්‍ථුප්පරණය, පුග්ගලපඤ්ඤත්තිප්පකරණය, ධාතුකථාප්පකරණය, විභඞ්ගප්පකරණය සහ ධම්මසඞ්ග ණීප්පකරණය පිළිවෙළින් අතුරුදහන් වේ. අනතුරු ව අඞ්ගුත්තරනිකායේ අතුරුදහන් වීම එකාදස නිපාතයෙන් ආරම්භව එකක නිපාතයෙන් අවසන් වේ. ඉන් පසු ව සංයුත්තනිකායට අයත් මහාවග්ගය, සළායතනවග්ගය, ඛන්‍ධකවග්ගය, නිදානවග්ගය හා සගාථවග්ගය පිළිවෙළින් අන්තර්ධාන වේ. සංයුත්තනිකාය අන්තර්ධාන වීමෙන් පසු ව මජ්ඣිමනිකයයේ උපරිපණ්ණාසකය, මජ්ඣිමපණ්ණාසකය සහ මූලපණ්ණාසකය පිළිවෙළින් අතුරදහන් වේ. ඉන් අනතුරු ව දීඝනිකායයේ පාටිකවග්ගය, මහාවග්ගය හා සීලක්ඛන්‍ධවග්ගය පිළිවෙළින් අතුරුදහන් වීමත් සමඟ සූත්‍ර පිටකයේ අන්තර්ධාන වීම අවසන් වේ. සූත්‍රපිටකය අතුරුදහන් වූ පසු වෙස්සන්තර ජාතකයෙන් ආරම්භ වන ජාතක අතුරුදහන් වීම ප්‍රතිලෝම වශයෙන් පුණ්ණක ජාතකය සහ මහානාරද ජාතකය අතුරුදන් ව අවසානයෙහි අපණ්ණක ජාතකය අතුරුදහන් වීමෙන් අවසන් වේ. අනතුරු ව විනයපිටකයට අයත් පරිවාර, ඛන්‍ධක, භික්ඛුනීවිභඞ්ග, මහාවිභඞ්ග සහ උපොසථක්ඛන්ධක පිළිවෙළින් අතුරුදහන් වේ. අවසානයෙහි ශ්‍රද්ධාවන්ත රජෙකු විසින් දහසින් බැඳි පසුම්බියක් රන්කරඬුවක තැන්පත් කොට එම රන්කරඬුව ඇතෙකු පිට තන්වා ''බුදුරජාණන් වහන්සේලා විසින් දේශනා කරන ලද සතරපද ගාථාවක් දන්නා අයෙක් වේ නම්, ඇතුපිට තබන ලද දහසින් බැඳි පසුම්බිය ගනිත්වා'' යයි නුවර බෙර හසුරුවනු ලැබේ. තෙවන වර බෙර හැසිරවීමෙන් අනතුරු ව ද එය නොගන්නා අයෙකු වේ නම්, නැවත එම පසුම්බිය රජ මැඳුර වෙත රැගෙන එනු ලැබේ. මෙලෙස බුදුරජාණන් වහන්සේ නමක විසින් දේශිත සතරපද ගාථාවක් දන්නා අයෙකු සොයගත නොහැකි අවස්ථාව උදා වූ කල්හි පරියත්තිය සම්පූර්ණයෙන් ම අතුරුදහන් වූයේ යයි සලකනු ලැබේ.

පරියත්ති අන්තර්ධානය පිළිබඳ ඉහත සඳහන් විවරණයෙහි සූත්‍රපිටකයට අයත් දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය සහ අඞ්ගුත්තරනිකාය අන්තර්ධාන වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කෙරේ. ජාතක අන්තර්ධානය ද එම විවරණයට ඇතුළත් වේ. එමගින් ඛුද්දකනිකායට අයත් ජාතකපාළිය අදහස් කෙරෙන්නේ ද යන්න සැක සහිත ය (Abeynayake (1984), p. 55). එබැවින් එම කෘතිය අදහස් කෙරෙන්නේ නම් ඛුද්දකනිකායට අයත් එක් කෘතියක අන්තර්ධානය පරියත්ති අන්තර්ධානය පිළිබඳ අට්ඨකථා විවරණයෙහි සාකච්ඡා කෙරෙන්නේ යැයි උපකල්පනය කළ හැකි ය. එහෙත් එම නිකායට අයත් (1) ඛුද්දකපාඨ, (2) ධම්මපද, (3) උදාන, (4) ඉතිවුත්තක, (5) සුත්තනිපාත, (6) විමානවත්‍ථු, (7) පෙතවත්‍ථු, (8) ථෙරගාථා, (9) ථෙරීගාථා, (10) නිද්දෙස, (11) පටිසම්භිදාමග්ග, (12) අපදාන, (13) බුද්ධවංස සහ (14) චරියාපිටක යන කෘති දාහතර අන්තර්ධාන වන ආකාරය පිළිබඳ සටහනක් දක්නට නොමැත.

සමස්ත බුද්ධවචනය නිකාය වශයෙන් සංග්‍රහ කරනු ලැබේ. එම සංග්‍රහ කිරීමට අනුව ඉහත සඳහන් කෘති පහළොවට අමතර ව අභිධර්මපිටකය සහ විනයපිටකය ඛුද්දකනිකායේ අන්තර්ගතයට අයත් වේ. අභිධර්මපිටකයේ හෝ විනයපිටකයේ හෝ අන්තර්ධානය පිළිබඳ විවරණයන්හි ද ඛුද්දකනිකායට අයත් කෘති අන්තර්ධාන වන්නේ

කෙසේ ද යන්න සඳහන් නොවේ. ඛුද්දකග්‍රන්ථ නාමයෙන් ගැනෙන ජාතක, නිද්දෙස, පටිසම්භිදාමග්ග, අපදාන, සුත්තනිපාත, ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, විමානවත්‍ථු, පෙතවත්‍ථු, ථෙරගාථා සහ ථෙරීගාථා පළමු සංගායනාවේ දී සංගායනා කොට අභිධර්මපිටකයට ඇතුළත් කළ බව දීඝභාණකයෝ විශ්වාස කළහ. එම කෘති අතරට චරියාපිටකය සහ බුද්ධවංසය ඇතුළත් කරන මජ්ඣිමභාණකයෝ එම ග්‍රන්ථ සූත්‍රපිටකයට ඇතුළත් බව විශ්වාස කළහ. තව ද ජාතක, පටිසම්භිදාමග්ග, නිද්දෙස, සුත්තනිපාත, ධම්මපද, උදාන, ඉතිවුත්තක, විමානවත්‍ථු, පෙතවත්‍ථු, ථෙරගාථා, ථෙරීගාථා සහ අපදාන අසුත්තනාමයෙන් ගැනෙන බුද්ධවචනයට අයත් බව සුමඞ්ගලවිලාසිනියෙහි සඳහන් වේ. ඒ අනුව ඛුද්දකග්‍රන්ථ නාමයෙන් ගැනෙන කෘතීන්හි බුද්ධවචනය ඇතුළත් බවත්, එම කෘතීන් ද ත්‍රිපිටකයට අයත් වන බවත් අට්ඨකථාවන්හි සඳහන් වේ. එනිසා එම කෘතීන්ගේ අන්තර්ධානය සම්බන්ධයෙන් ද පරියත්ති අන්තර්ධානයෙහි ලා සාකච්ඡා කළ යුතු බව පැහැදිලි ය. එහෙත් එවන් සාකච්ඡාවක් එම විවරණයෙහි දක්නට නොමැත. එය පරියත්ති අන්තර්ධානය නමැති සන්දර්භය තුළ පරියත්ති යන්නෙන් බුද්ධවචනය ඇතුළත් ත්‍රිපිටකය හා තදනුබද්ධ අට්ඨකථා අදහස් කෙරේ යන ඉහත සඳහන් අට්ඨකථා විවරණය හා ගැටෙන බව හඳුනාගත හැකි ය.

**නිගමනය**

ඉහත සඳහන් සාකච්ඡාවට අනුව පරියත්ති අන්තර්ධානය පිළිබඳ සාකච්ඡාව ආරම්භ වන අවධියෙහි ථේරවාදීන් අතර ඛුද්දකනිකාය හෝ එම නිකායට අයත් ග්‍රන්ථ සංඛ්‍යාව සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් නොපවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. ඛුද්දකනිකාය සකස්වීමට පෙර සද්ධර්ම අන්තර්ධානය පිළිබඳ සාකච්ඡාව මනෝරථපූරණී නමැති අඞ්ගුත්තරනිකායට්ඨකථාවේ සීහළට්ඨකථාවට ඇතුළත් වන්නට ඇතැයි ද සිතිය හැකි ය. ආචරිය බුද්ධඝෝෂ හිමියෝ ඛුද්දකනිකාය හා එහි අන්තර්ගතය පිළිබඳ ව සුමඞ්ගලවිලාසිනියෙහි දී මෙන් ම සමන්තපාසාදිකාවෙහි දී ද සාකච්ඡා කරති. මනෝරථපූරණියේ කර්තෘත්වය පවරනු ලබන්නේ ද උන්වහන්සේට ය. එහෙත් සද්ධර්ම අන්තර්ධානය පිළිබඳ සකාච්ඡාවේ දී ඛුද්දකනිකායට අයත් ජාතක හැර ඉතිරි කෘති දාහතර අන්තර්ධාන වන්නේ කෙසේ ද යන්න සඳහන් නොකිරීම ගැටලුවකි. එම කරුණ උන්වහන්සේට අතපසු වන්නට ඇතැයි ද සිතිය නොහැකි ය. තොසිඉචි එන්දොට අනුව පරියත්ති අන්තර්ධානය පිළිබඳ අදහස ථේරවාදීන් අතර වළගම්බා රාජ්‍ය සමයේ දී ප්‍රභවය වන්නට ඇත. එම කාලයේ දී නිද්දෙසපාළිය අන්තර්ධාන වීමේ තර්ජනයට මුහුණ දී තිබුණු බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ. නිද්දේසපාළිය වළගම්බා රාජ්‍ය සමයේ දී ත්‍රිපිටකයට අයත් කෘතියක් සේ සලකන ලද්දේ නම්, එම කෘතියේ අන්තර්ධානය පරියත්ති අන්තර්ධානය පිළිබඳ විවරණයෙහි සඳහන් නොවීම ද ගැටලුවකි. ඛුද්දකනිකායට අයත් ධම්මපද, ථෙරගාථා, ථෙරීගාථා සහ බුද්ධවංස වැනි ග්‍රන්ථ ගාථාවලින් සමන්විත වේ. සතරපද ගථාවක් සොයාගත නොහැකි අවස්ථාවෙන් එම ග්‍රන්ථයන්ගේ අන්තර්ධානය අදහස් කෙරෙන්නට ඇතැයි සිතිය හැකි ය. එහෙත් එම කෘති අන්තර්ධාන වන්නේ කෙසේ ද යන්න පැහැදිලි ව පරියත්ති අන්තර්ධානය පිළිබඳ විවරණයෙහි සඳහන් නොවීම ගැටලුවකි. මේ අනුව පරියත්ති අන්තර්ධානය පිළිබඳ ව අට්ඨකථාවන්හි ඇතුළත් විවරණය ත්‍රිපිටක සාහිත්‍යයේ ඓතිහාසික සංවර්ධනය අධ්‍යයනයෙහි ලා නව අලෝකයක් සපයන බව හඳුනාගත හැකි ය.

**මුඛ්‍ය පදඃ** අට්ඨකථා, අන්තරධාන, ත්‍රිපිටක, පරියත්ති අන්තර්ධානය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*මනෝරථපූරණී නාම අඞ්ගුත්තරනිකායට්ඨකථා*. ප්‍රථම භාගය. (1923). සයිමන් හේවාවිතාරණ ග්‍රන්ථ මාලාව.

Abeynayake, Oliver. (1984). *A Textual and Historical Analysis of the Khuddaka Nikāya*. Colombo: Tisara Press.

Endo, Thoshiichi. (2013). S*tudies in Pali Commentarial Literature: Sources, Controversies and Insights*. Hong Kong: Center of Buddhist Studies.